# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 මැයි මස 22 වන දින

## II වන කොටස

## අතිරේකය

(2024.05.29 දින නිකුත් කරන ලදී)


# රබර් පාලන (සංශෝධන)

**රබර් පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (436 වන අධිකාරය වූ) රබර් පාලන පනත සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, "පාලක" සහ "රබර් පාලක" යන යෙදුම් වෙනුවට "අධ්‍යක්ෂ-ජනරාල්" යන යෙදුම ප්‍රතියෝජනය කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර, එය 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ VI වන කොටසේ "රබර් පාලක අරමුදල" සහ "රබර් උපදේශක මණ්ඩලය" යන ශීර්ෂය ඉවත් කරනු ලබන අතර, "රබර් උපදේශක මණ්ඩලය" යන නව ශීර්ෂය ඇතුළත් කරනු ලැබේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 36, 37, 38, 39A සහ 50 යන වගන්ති ඉවත් කරනු ලබන අතර එය 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, "පාලක" යන යෙදුම සඳහා දැනට පවත්නා අර්ථ නිරූපණය ඉවත් කර "අධ්‍යක්ෂ ජනරාල්" යන යෙදුම සඳහා අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීම වේ.

එල්.ඩී.-ඕ. 31/2022

## රබර් පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2024 අංක     දරන රබර් පාලන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

436 වන අධිකාරයට සහ වෙනත් යම් ලිඛිත නීතියකට සිදු කරනු ලබන පොදු සංශෝධන

**2.** (1) (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (436 වන අධිකාරය වූ) රබර් පාලන පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක "පාලක" සහ "රබර් පාලක" යන වචන යෙදෙන සෑම ස්ථානයකම ඒ වචන වෙනුවට, ප්‍රධාන ප්‍රඥප්තියෙහි සහ වෙනත් යම් ලිඛිත නීතියක "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය;

(2) වෙනත් යම් ලිඛිත නීතියක හෝ යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක, ආකෘති පත්‍රයක, වෙනත් සාධන පත්‍රයක හෝ ලේඛනයක "පාලක" සහ "රබර් පාලක" සම්බන්ධයෙන් සිදු කරනු ලබන සෑම සඳහන් කිරීමක් ම, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට සහ ඊට පසුව "රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා" සම්බන්ධයෙන් සිදු කරනු ලබන සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම්ගනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 26 වන වගන්තිය ඉවත් කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 26 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි VI වන කොටසෙහි ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි "VI වන කොටස" යන වචන සහ ඉලක්කම්වලට ඉක්බිතිව ම දැක්වෙන ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ:-

**"රබර් උපදේශක මණ්ඩලය"**

**5.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 36, 37, 38, 39, 39අ සහ 50 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 36, 37, 38, 39, 39අ සහ 50 වන වගන්ති ඉවත් කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 52 වන වගන්තිය, එහි "පාලක" යන්නෙහි අර්ථ නිරූපණය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 52 වන වගන්තිය සංශෝධනය කිරීම

> ""අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන්නෙන්, මේ පනත යටතේ පත් කරන ලද හෝ පත් කරන ලද බවට සලකනු ලබන, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදහස් වේ;".

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව